# බුදුරුවගල පුරාවිද්‍යා පරිශ්‍රය සහ තදාශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍ර සඳහා උරුම කළමනාකරණ සැලැස්මක්

*එච්.ඩී.එස්. ප්‍රනාන්දු [1], එම්.සී.එස්. කෝස්තා [2], එච්.ටී.ටී.ඒ. සුදර්මන් [3], ඩබ්.ඒ.එන්.ඒ. වික්‍රමසිංහ [4]*

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බුදුරුවගල හා තදාශ්‍රිත පුරාවිද්‍යා පරිශ්‍රය උරුම සංචාරක සන්දර්භයක් වශයෙන් සුවිශේෂත්වයක් උසුලනු ලබයි. ඒ අනුව බුදුරුවගල හා තදාශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍රයන් හි සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීමෙහිලා පවතින උරුම කළමනාකරණ සැලසුම වැඩිදියුණු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. පර්යේෂණ ගැටලුව වනුයේ බුදුරුවගල හා තදාශ්‍රිත පුරාවිද්‍යා පරිශ්‍රයන් සංචාරක ආකර්ෂණය සහිත ප්‍රදේශ වශයෙන් ප්‍රවර්ධනය කිරීමට පවත්නා ගැටලු හා අවස්ථා කවරේද? යන්න හඳුනා ගැනීම යි. පර්යේෂණ ක්‍රමවේදය යටතේ බුදුරුවගල, මාලිගාවිල, දඹේගොඩ, යුදගනාව, දෙමටමල් විහාරය හා කුරුල්ලන්ගල කේන්ද්‍ර කර ගනිමින් ක්ෂේත්‍ර අධ්‍යයන, පූර්ව පර්යේෂණ හා සාහිත්‍ය විමර්ශන ඇසුරෙන් දත්ත රැස් කිරීම සිදු වූ අතර දත්ත විශ්ලේෂණයේ දී අදාළ දත්ත පාදක කර ගනිමින් උක්ත ක්ෂේත්‍රයන් හි සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීමට පවත්නා ගැටලු හා අවස්ථා කවරේද යන්න හඳුනා ගන්නා ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල වශයෙන් යතෝක්ත ක්ෂේත්‍රයේ ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික අවධිවලට අයත් උරුම රැසක් හඳුනා ගැනීමට හැකි විය. එම උරුම අතර ප්‍රාග් ඓතිහාසික සිතුවම්, අල්ප උන්නත මහායානික බෝධිසත්ව ප්‍රතිමා, ශ්‍රී ලංකාවේ විශාලතම අනාබද්ධ හිටි බුද්ධ ප්‍රතිමාව, ශ්‍රී ලංකාවේ විශාලතම අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමාව, ශ්‍රී ලංකාවේ දැනට හමුවන එකම යුගල මුරගල වැනි වැදගත් උරුමයන් රැසක් හඳුනාගැනීමට හැකි විය. කෙසේ නමුත් ස්මාරක පාදා ගැනීම හා සංරක්ෂණය සිදු නොකිරීම, යටිතල හා සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය නොවීම, පුරාවිද්‍යා ක්ෂේත්‍රයන් සඳහා පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවැසි විධි විධාන ක්‍රියාත්මක නොවීම සහ උරුම අගයන් පිළිබඳ ප්‍රචාරණය හා ප්‍රවර්ධනය නිසි ආකාරව සිදු නොවීම යනාදී ගැටලු හඳුනා ගැනීමට හැකි විය. මෙහි ප්‍රවර්ධන අවස්ථා ලෙස අධ්‍යයන ප්‍රදේශ තුළ පවතින ලෝක උරුම වටිනාකමකින් යුතු නිර්මාණ වන බුදුරුවගල බෝධිසත්ව ප්‍රතිමා පන්තිය, දෙමටමල් විහාර මුරගල වැනි උරුමයන් ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කොට සංචාරක ආකර්ෂණය ලබා ගැනීම, සංචාරකයන්ට අවට ඇති ස්වභාවික නිර්මිතයන් (බුදුරුවගල වැව, කුරුල්ලන්ගල පර්වතය) ආශ්‍රිතව ත්‍රාසජනක හා විනෝදාත්මක ක්‍රීඩා (බෝට්ටු සේවා, කඳු නැඟීම) ආදිය සිදුකිරීමට පහසුකම් සැලසීම යනාදිය පෙන්වා දිය හැකි ය. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් අනාවරණය කරගත් දත්ත ඇසුරෙන් පවතින කෞතුකාගාර යාවත්කාලීන කිරීම, ආරක්ෂක විධි විධාන වැඩි දියුණු කිරීම හා ප්‍රාදේශීය ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම වැනි යෝජනා ද ඉදිරිපත් කළ හැකි ය. මේ අනුව උක්ත ප්‍රදේශය මනා උරුම කළමනාකරණ සැලසුමක් තුළින් සංචාරක ආකර්ෂණය සහිත ක්ෂේත්‍රයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමට ඉහළ අවකාශයක් පවතින බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පද:*** කළමනාකරණය, උරුමය, ඌව පළාත, බුදුරුවගල, සංචාරක

[1,2,3,4] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය. sadaruwanchandu74@gmail.com